www.wsws.org ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# කුමන්ත්‍රණයකින් බලයට පත් හොන්ඩුරාස් පාලන තන්ත්‍රය කුරිරු මර්දනයක් දියත් කරයි

## Honduran coup regime launches brutal crackdown

**බිල්වෑන් ඕකන් විසිනි**

**2009 අගෝස්තු 01**

**හො**න්ඩියුරාස් ජනාධිපති මනුවෙල් සෙලායා පෙරලා දමා දැනට මසකට පමන කලින් ජූනි 28 දින කුමන්ත්‍රනකාරීව බලය අල්ලා ගැනීම තුලින් ස්ථාපිත කරන ලද තන්ත්‍රයට එරෙහිව වර්ධනය වන ජනතා ප්‍රතිරෝධය මර්දනය කිරීමේ උත්සාහයක යෙදෙමින් පොලීසිය හා හමුදාව අගනුවර වන ටෙගුසිගැල්පාහි බ්‍රහස්පතින්දා පැවති පෙලපාලිවලට එරෙහි කුරිරු මර්දනයක් දියත් කලේය.

පුවත්පත් වාර්තාවලට අනුව, කඳුලුගෑස්, ප්‍රබල ජලදහරා, බැටන් පොලු සහ තුවක්කුවලින් සන්නද්ධව පොලිස් නිලධාරීන් හා සොල්දාදුවන් පෙලපාලිකරුවන් වෙත එල්ල කල ප්‍රහාරවලින් දුසිම්ගනන් ජනයා තුවාල ලැබූ අතර 150 දෙනෙක් අත් අඩංගුවට පත් විය.

තුවාල ලැබූවන් අතරෙන් කෙනෙකු, සිය හිසට වෙඩි පහරකින් තුවාල ලත් 38 හැවිරිදි ගුරුවරයෙක්, රොජර් වැලේජෝ සිය දිවි ගලවාගැනීමේ සටනක යෙදී සිටියි. වෙඩි ප්‍රහාර ආවේ කුමන දිසාවෙන් දැයි පැහැදිලි නො වුවද සාක්ෂිකරුවන් කියා සිටියේ වෙඩි තැබීම අරඹන ලද්දේ පෙලපාලියට රිංගාගත් සිවිල් ඇඳුමින් සැරසී සිටි පොලිස් නිලධාරීන් විසින් බවයි. සිය සගයන් විසින් රෝහලට ගෙන යන අතර තුර හෘදයාබාධ දෙකකට ගොදුරු වූ ඔහු අවදානම් තත්ත්වයක පසුවන බව එම රෝහල් ලේඛනවල සටහන් තබා ඇත.

අත් අඩංගුවට ගන්නා ලද අය අතර හොන්ඩියුරියානු බීම කම්කරු සංගමයෙහි සභාපති හා ජනාධිපතිවරනයට ස්වාධීනව තරග වැදි කාලොස් රෙයස් ද විය. අත් අඩංගුවට පත් වීමෙන් අනතුරුව දියවැඩියා රෝගයෙන් පෙලෙන 76 හැවිරිදි, රෙයස්ට ආරක්ෂක හමුදා විසින් බරපතල ලෙස පහර දෙන ලදුව ඔහුගේ අතක් කැඩී හිසෙහි තුවාලයක් සිදුව ඇත.

රඳවා ගත් අය අතර, වෘත්තීය සමිති නිලධාරියෙකු හා ෆ්‍රෙන්ටේ නසිඔනාල් කොන්ට්‍රා එල් ගොල්පෙ ඩි එස්ටාඩෝ (කුමන්ත්‍රනයට එරෙහි ජාතික පෙරමුන) සංවිධානයෙහි නායකයෙකු වන ජුවාන් බරාහෝනා ද විය.

මෙයට පෙරාතුව පැවති විරෝධතා තුල දී නිදහසේ ක්‍රියාත්මක වීමට ඉඩ හරින ලද වාර්තාකරුවන්ට එරෙහිව හමුදා භට කන්ඩායම් හා පොලීසිය ප්‍රචන්ඩත්වය මුදාහැරීය. *ලා ජොර්නාඩා* නමැති මෙක්සිකානු දිනපතා පුවත්පතට අනුව, *ප්‍රෙන්සා ලැටිනා* පුවත්පතෙහි රොබර්ටෝ බරාට හා *හබ්ලා හොන්ඩියුරාස්* පුවත්පතෙහි ඔස්කා එස්ට්‍රඩාට පහර දෙන ලදුව ඔවුන්ගේ උපකරනවලට හානි කරන ලදී. "මේ රට වැඩ වරද්දාගෙන ඇත්තේ ඔබේ වරදිනි. මෙහි වාර්තා කිරීමට කිසිවෙක් නැතැ"යි පොලීසිය වාර්තාකරුවන්ට පැවසීය. "ඔබ නිකාවෙකු (නිකරගුවා වැසියෙකු) වේ නම්, අපි ඔබ මරන්නෙමු."

රටෙහි මානව හිමිකම් වෙනුවෙන් පෙනී සිටින ප්‍රධාන කන්ඩායමක් වන හොන්ඩියුරාස්හි රඳවාගත් හා අතුරුදහන්වූ පුද්ගලයින්ගේ නෑදෑයින්ගේ කමිටුවේ (කොෆාඩෙහ්) වාර්තාවකට අනුව, තුවාල ලත් විරෝධතා නායකයින් පසුපස ගොස් ඔවුන් අල්ලා ගැනීම සඳහා රෝහල්වල හදිසි රෝගීන්ට වෙන්කොට ඇති කාමර පරීක්ෂා කිරීම සඳහා මිල්ටරියෙහි හා පොලිස් බුද්ධි අංශයෙහි ඒජන්තයන් පිටත් කර යවා ඇත.

දහස් ගනන් කම්කරුවන් නගරයෙන් පිටතට දිවෙන මහා මාර්ග අවහිර කිරීමට යත්නදරත්ම - මෙය පසුගිය සති කිහිපය තුල විරෝධය පෑම සඳහා යොදාගන්නා ලද ක්‍රමයකි - මර්දනය දියත් කෙරින. ආරක්ෂක හමුදා බොහෝ අවස්ථාවල දී පෙලපාලියට සම්බන්ධ වූවන්ට ප්‍රහාර එල්ල නොකොට බලා සිටියහ.

දැඩි ප්‍රහාර එල්ල කිරීමෙන් අනතුරුව සවස්වරුවෙහි කුමන්ත්‍රනකාරී තන්ත්‍රයේ නායක, රොබර්ටෝ මිචෙලෙට්ටි, හොන්ඩියුරියානු රූපවාහිනිය ඉදිරියේ පෙනී සිටිමින් මෙසේ ප්‍රකාශ කලේ යː "මේ රටෙහි පිලිවෙලක් ඇති කිරීමට අපි ක්‍රියා කරමු. 110 දෙනෙකුට මේ රට අවහිර කිරීමට ඉඩ දී බලා සිටීමට මහජනයා සූදානම් නොවනු ඇත."

එසේ වුවද, මිචෙලෙට්ටි ප්‍රතිචාරය දැක්වූයේ "ජනතාවගේ" උත්සුකතාවයන්ට නොව, හොන්ඩියුරානු කතිපයාධිපත්‍යයෙහි හා විදේශ ප්‍රග්ධනයෙහි

උත්සුකයන්ට බව පැහැදිලි ය. විරෝධතාවල හා වැඩ වර්ජනවල බලපෑම හා විදේශ නය සිදීයාම පිලිබඳව මේ දෙකොටස ම වඩ වඩාත් බලාපොරොත්තු සුන්වූ තත්ත්වයට පත්ව සිටියි.

මහා මාර්ග අවහිර කිරීම් ප්‍රචන්ඩ ලෙස විසුරුවා හැරීම මිචෙලෙට්ටි විසින් නියෝග කරන ලද්දේ හොන්ඩියුරානු වරායවලට නිෂ්පාදිත භාන්ඩ ප්‍රවාහනය කිරීම අවහිර කිරීම තුලින් ඩොලර් මිලියන ගනන් පාඩු තමන්ට අත් විදීමට සිදුවන බවට වෙලඳ ව්‍යාපාරිකයන් පැමිනිලි කිරීමෙන් අනතුරුව බව ටෙගුසිගැල්පාවෙහි විදේශ තානාපතිවරයෙකු වාර්තා කල බවට ඒඑෆ්පී පුවත්පත් ඒජන්සිය උපුටා දැක්වීය. ඇතැම් කර්මාන්ත ශාලාවල නිෂ්පාදනය සියයට 25කින් හෝ ඊට වැඩි ප්‍රමානයකින් පහත බැස ඇත.

ගැඹුරුවන අර්බුදයට හොන්ඩියුරානු කම්කරුවන් මිලක් ගෙවන බවට හොන්ඩියුරාවේ ස්ත්‍රීන්ගේ එකමුතුව නමැති ආයතන කර්මාන්ත අංශයෙහි කම්කරුවන් නියෝජනය කරන සංවිධානයක් ප්‍රකාශ කර සිටිය - ඒ සිය රැකියාවලිනි. "කුමන්ත්‍රනයට අරමුදල් සැපයූ මැක්විලාඩෝරේස් කන්ඩායම දැන් එහි ආදීනව අත් විඳිමින් සිටී" යයි මේ කන්ඩායමේ සභාපති මරියා ලුයිසා රෙගලාඩෝ පැවසුවා ය. "කතිපයාධිපතීන් කන්ඩායමක් විසින් නිර්මානය කරන ලද මේ තත්ත්වයට ගොදුරුවන්නේ ඔවුනට වඩා කම්කරුවන් ය."

එක්සත් ජනපදයේ රෙදිපිලි සමාගම් ගනනාවක් ද ඇතුලත් මැක්විලාඩෝර්ස්වරුන්ගේ හොන්ඩියුරානු සමාගම මිචෙලෙට්ටි තන්ත්‍රයට උදව්වෙන ප්‍රකාශයක් මේ මස මුලදී නිකුත් කලේය.

"හොන්ඩියුරාවේ දේශපාලන අර්බුදය තිබියදීත්, අපගේ ව්‍යවස්ථාව ක්‍රියාත්මක වෙමින් පවතින බව අපි පිලිගනිමු. ආන්ඩුවේ අංශ තුනම තමතමන්ගේ කාර්භාරයන් ඉටු කරන බවටත් ආර්ථික, මූල්‍ය, කම්කරු හා සමාජයීය කටයුතු පෙර සේ ම වෙනසක් නොමැතිව හෝ හොනන්ඩුරාස්හි ආන්ඩුවේ මර්දනයකට යටත් නොවී ක්‍රියාත්මක වන බවත් අපි පිලිගනිමු"යි එම ප්‍රකාශනයෙන් කියැවින.

සැබැවින්ම, මෙය මුල සිට අග දක්වා ම අමූලික බොරුවකි. ඡන්දයෙන් තෝරා පත් කර ගත් ජනාධිපති මිල්ටරිය විසින් බලයෙන් පහකරන ලදුව පිටුවහල් කිරීමට හමුදාව විසින් බලෙන් ගුවන් යානයකට නංවන ලද තත්ත්වයක් යටතේ ය මෙම ප්‍රකාශනය නිකුත් කරන ලද්දේ. කුමන්ත්‍රනකාරීව බලය අල්ලා ගැනීමට විරෝධය දැක්වූ 1,000කට අධික පිරිසක් අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගෙන ඇත; ප්‍රචන්ඩව බලය අල්ලා ගත් තන්ත්‍රය විවේචනය කරන මාධ්‍ය වසාදමා ඇති අතර විරෝධතාවන්ට සම්බන්ධ වූ විරුද්ධවාදීන් ගනනාවක් ඝාතක කන්ඩායම් විසින් මරා දමා ඇත.

"එ රටෙහි මෑත සිද්ධීන් පිලිබඳව තමන් බලවත් ලෙස කනස්සල්ලට පත් වී සිටින" බව ප්‍රකාශ කරමින් හොන්ඩියුරාස්හි ක්‍රියාත්මක වන එකලස් කිරීමේ කර්මාන්තශාලා අතුරින් විශාලතම එක්සත් ජනපද සමාගම් තුනක් වන අඩිඩාස් ගෲප්, නයිකි ඉන්කෝපරේෂන් හා ගැප් ඉන්කෝපරේෂන් යන සමාගම් එක්සත් ජනපද රාජ්‍ය ලේකම් හිලරි ක්ලින්ටන් වෙත යවන ලද ලිපියක් මේ සතිය මුලදී ප්‍රසිද්ධියට පත් කලහ.

ප්‍රකාශයෙන් තව දුරටත් මෙසේ කියැවිනි: "ඡන්දයෙන් තෝරා පත් කරගන්නා ලද ජනාධිපති, කොන්ග්‍රසය හා ශ්‍රේෂ්ඨාධිකරනය අතර බරපතල මත භේද තිබෙන බව අපි අවබෝධ කරගෙන ඇත්තෙමු. එනමුදු, මෙම මතභේද විසඳගත යුත්තේ මිල්ටරි මැදිහත්වීම් තුලින් නොව සාමකාමී, ප්‍රජාතන්ත්‍රවාදී සංවාද තුලිනි."

සෙලායා ජනාධිපති ධූරයෙහි යලි පිහිටුවීමට ඉල්ලීමක් ප්‍රකාශනයෙහි සඳහන් නොවින. එය වොෂිංටනයෙහි අන පරිදි කොස්ටා රිකාවෙහි ජනාධිපති ඔස්කාර් අරියාස් විසින් භාරගෙන ඇති මැදිහත් වීමේ ප්‍රයත්නයන් දිගටම ගෙන යාම සඳහා ආයාචනයක් සේ දිස්විනි. යටත් පිරිසෙයින් සෙලායාගේ අනුප්‍රාප්තිකයා පත් කිරීම සඳහා නොවැම්බරයෙහි මැතිවරනයක් පවතින තාක් කල් සෙලායා රටින් පිට කර තැබීමේ අරමුන ඇතිව සාකච්ඡා දිග් ගැස්සීමට ප්‍රචන්ඩව බලය අල්ලා ගත් තන්ත්‍රයට මෙම සාකච්ඡා තුලින් ඉඩ ලැබෙන අතර මෙම සාකච්ඡා එම තන්ත්‍රය සුජාත කිරීමේ කාර්යභාරය ඉටු කර ඇත.

එක්සත් ජනපද රෙදිපිලි සඳහා හොන්ඩියුරාසය ලොව තෙවැනි විශාලතම වෙලඳපොල වන අතර එක්සත් ජනපද වෙලඳපොලට සිව් වැනි විශාලතම නිමි ඇඳුම් සපයන්නා ද වෙයි. හොන්ඩියුරානු රෙදිපිලි අංශයෙහි විශාලතම ආයෝජකයින් අතර එක්සත් ජනපදයේ ෆෲට් ඔෆ් ද ලූම්/රසල් සංස්ථාව හා හැනස්බ්‍රැන්ඩ්ස් සමාගම් ද කැනේඩියානු සමාගමක් වන ගිල්ඩාන් ද වෙති.

ප්‍රචන්ඩව බලය අල්ලා ගැනීමට දක්වන විරෝධය මර්දනය කිරීම අරමුනු කොට ගත් තවත් පියවරක් ලෙස, සේවයට වාර්තා නොකරන අය සම්බන්ධයෙන් නිගමනය කිරීම සඳහා රජයේ කාර්යාලවල හා පාසල්වලට පරීක්ෂකවරුන් පිටත් කර හරින බවට මිචෙලෙට්ටි තන්ත්‍රය නිවේදනය කලේ ය. සේවයෙහි රැඳී නොසිටින අයගේ වැටුප් ඒ අනුව අඩු කරනු ඇත. සතියකට දින තුනක් පන්ති කාමරවල රැඳෙමින් බ්‍රහස්පතින්දා සහ සිකුරාදා දිනවල පාරට බසින කුමන්ත්‍රනයට විරෝධය දක්වන්නන්ගේ කොඳු නාරටිය වූ ගුරුවරුන් මෙහි ඉලක්කය බවට පත්ව ඇත.

ටෙගුසිගැල්පාවෙහි මර්දනය දියත් කරන අතරවාරයේ මනුවෙල් සෙලායා, නිකරගුවානු අගනුවර වන මනාගුවාහි එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුවේ නියෝජිත පිරිසක් සමග සාකච්ඡාවකට සම්බන්ධ විය. මේ නියෝජිත පිරිසට හොන්ඩියුරාස්හි ඇමරිකානු තානාපති හියුගෝ ලොරෙන්ස් ද ඇතුලු විය. ලොරෙන්ස් වූ කලී බුෂ් පාලන තන්ත්‍රයේ අවධියෙහි සිට මේ තනතුරෙහි රැඳී සිටින අයෙකි. වාර්තාගතවන පරිදි පසු ගිය මස සෙලායා බලයෙන් පහ කිරීමට පෙරාතුව මිචෙලෙට්ටි හා අනිකුත් කුමන්ත්‍රනකාරී නායකයින් සමග මොහු පුලුල් සාකච්ඡා පවත්වා නැත.

හමුවෙන් අනතුරුව ලොරෙන්සේගේ "අවංකකම" පිලිබඳව සෙලායා ලොරෙන්ස්ට පැසසීය. "අද දින අධි සංනිවේදන නාලිකාවක් විවෘත කර ගන්නෙමු. ඉන් ප්‍රතිඵල අපි අපේක්ෂා කල යුත්තෙමු."යි සෙලායා කියා සිටියේ ය. කුමන්ත්‍රනකාරී තන්ත්‍රය මත පීඩනය වැඩි කරන ලෙස එක්සත් ජනපද ආන්ඩුවෙන් තමා ඉල්ලා සිටින බවත් එසේම කුමන්ත්‍රනයට සම්බන්ධ නිලධාරින්ගේ වීසා පහසුකම් තහනම් කිරීම ද ඇතුලත් කරන ලෙසත් ඔහු ඉල්ලා සිටියේ ය. කුමන්ත්‍රනයේ සාමාජිකයන් සිව් දෙනෙකුගේ වීසා බලපත්‍ර තමන් විසින් අවලංගු කොට ඇති බවට රාජ්‍ය දෙපාර්තමේන්තුව මේ සතිය තුල මුල දී නිවේදනය කලේ ය.

තමන් යලි තනතුරෙහි පිහිටුවීම සඳහා කුමන්ත්‍රනය ආරම්භයේ සිට ම වොෂිංටනය වෙත සෙලයා බලාපොරොත්තු රැඳවීය. කොස්ටා රිකාවේ අරියාස්ගේ මැදිහත් වීම තුලින් එලඹෙන ලද ඊනියා සැන් ජොසේ ගිවිසුමෙහි කොන්දේසි ඔහු නැවත නැවතත් පිලිගෙන ඇත. සෙලායා බලයෙන් පහකල අයගේ ආධිපත්‍යයෙන් යුතු "ජාතික එකමුතුවක හා ප්‍රතිසංධානයක" ආන්ඩුවක් තුල නාමික නායකයා වශයෙන් යලි ජනාධිපති ධුරයට පත් කිරීම මේ ගිවිසුමෙහි අරමුන විය. කුමන්ත්‍රනය ක්‍රියාත්මක කල අයට ද, ඉන් අනතුරුව සාපරාධී මර්දනයට සම්බන්ධ අයට ද මෙම ගිවිසුම මගින් ප්‍රථම වශයෙන් පොදු සමාවක් පිලිගන්වති.

ලොරෙන්ස්-සෙලායා ආන්ඩුවට මිචෙලෙට්ටි දැක්වූයේ කෝපාවිෂ්ට ප්‍රතික්‍රියාවකි. එය හොන්ඩියුරාස්හි අභ්‍යන්තර කටයුතුවලට "ඇඟිලිගැසීමේ ක්‍රියාවක්" වශයෙන් ඔහු හැඳින්වීය.

සෙලායා යලි ජනාධිපති ධුරයට පත් කිරීම සලකා බැලීමට තම පාලනය සූදානම්ව සිටින බවට මිචෙලෙට්ටි ඉඟිකරන ලදැයි සතිය මුල දී වාර්තා විය. එවැනි කවර විසඳුමකට පැමිනීම සම්බන්ධයෙන් හෝ තව දුරටත් විරුද්ධ වී සිටින කතිපයාධිපත්‍යයෙහි කොටස්වලට කරුනු ඒත්තු ගැන්වීමට සහාය වීම සඳහා දූතයෙකු පිටත් කර එවන ලෙස ඔහු අරියාස් ගෙන් ඉල්ලා සිටියේ ය.

එසේ වුව ද, බ්‍රහස්පතින්දා සවස ඔහු තමන් කලින් දැරූ ස්ථාවරය නැවත අවධාරනය කලේ ය. ඔහු කියා සිටියේ සෙලායාට යලි හොන්ඩියුරාසයට ඒමට ඉඩ සලසන්නේ බලය අයුතු ලෙස පාවිච්චි කිරීම පිලිබඳ චෝදනා මත නඩු විභාගයකට පෙනී සිටීමට පමනක් බවත් "එනමුදු, කුමන තත්ත්වයන් යටතේ වුව අප ඔහුට යලි බලයට පැමිනීමට ඉඩ නොතබන" බවත්ය.

හොන්ඩුරාස්හි මර්දනය පිලිබඳ කිසිදු හෙලාදැකීමක් ඔබාමා පාලන තන්ත්‍රය විසින් නිකුත් කොට නැත. එය මිචෙලෙට්ටි තන්ත්‍රයෙහි කල්මැරීමේ උපාය මාර්ගයන්ට ඉඩ සලසා දී ඇත. අරියාස්ගේ මැදිහත් වීමත් සමග කුමන්ත්‍රනකාරීන්ගේ අරමුනු ඉටු කිරීමට ඔබාමා පාලන තන්ත්‍රය උත්සුක වී ඇත. ආරම්භයේ සිට ම වොෂිංටනය කුමන්ත්‍රනයට සහාය වූ බව විශ්වාස කිරීමට සෑම අතින්ම හේතු ඇත.

© www.wsws.org